# ග්‍රැමෆෝන් තැටි යුගය



ගීත තැටිගත කිරීමේ තාක්ෂණය පිළිබඳ දැනුමක්, අවබෝධයක් නොතිබූ වකවානුවක සිදුවූ ග්‍රැමෆෝන් තැටියේ ආගමනය ශ්‍රී ලාංකිකයන්ට නවමු අතිදැකීමක් විය. 1888 දී පමණ නිපදවූ ග්‍රැමෆෝන් යන්ත්‍රය 20 වන සියවසේ ප්‍රථම දශකය තුළ, එනම් 1903 දී පමණ ලංකාවට ආනයනය කළ අතර මේ සඳහා පුරෝගාමීව කටයුතු කළේ කොළඹ ඇපොතිකර සමාගම, වෝකර්ස් සහ පුත්‍ර සමාගම, W.E. බැස්ටියන් සමාගම, H. දොන් පොරෝලිස් සමාගම වැනි සමාගම්ය. පිටරටින් ආනයනය කළ මුල්ම තැටිවල අසන්නට ලැබුණේ ඉංග්‍රීසි, හින්දි, බෙංගාල, අරාබි , ජපන් වැනි භාෂාවන්ගෙන් ලියැවුණු ගීතයි.

1906 පමණ වන විට ලංකාවේ ද තැටි කැපීම ආරම්භ කළ අතර මේ සඳහා H. දොන් කරෝලිස් සමාගම පළමුව දායකත්වය සපයන ලදි. ග්‍රැමෆෝන් තැටියකට පළමුවෙන් ගීතයක් ගායනය කළේ ***ග්‍රේස් මාග්‍රට් ද සිල්වා වර්ණකුලසූරිය*** ගායිකාවයි. 1880 දී පමණ ලංකාවේ පැතිරුණු නූර්ති නාට්‍යයන්හි ගීත මේ වන විට ලංකාවේ ප්‍රචලිතව පැවති අතර සිංහල භාෂාවෙන් මුලින්ම ග්‍රැමෆෝන් තැටියට නැගුණේ මේ වකවානුව වන විට ජනප්‍රියව පැවති නූර්ති ගීතයි.

ග්‍රැමෆෝන් තැටි යුගයේ බිහි වූ පහත නූර්ති ගීත ශ්‍රවණය කරන්න.

- හරිම් රජ සැපා ...
- සීතා මා සිරියා ඉන්නේ ...

# ආරම්භක යුගයේ ගායක ගායිකාවන්

- ඇනී රොට්ලස්
- ඇනී බොතේජු
- D. මාර්ෂල් පෙරේරා

මේ වකවානුවේ දී නූර්ති ගීත මෙන්ම නූර්ති ගීත තනුව අනුව වෙනත් ගීත ද නිර්මාණය විය.

උදා : H.W. පෙරේරා ගැයූ කොණ්ඩෙ පීරාලා ගීතය (දන්නෝ බුදුන්ගේ ගීතයේ තනුව අනුව)

මේ යුගයේ ගායිකාවන් ගීත ගායනය සඳහා යොමුවීම දුර්ලභ වූ අතර කාන්තා කටහඬින් පුරුෂයින් විසින් ගීත ගායනය ද සිදුවිය. මේ යුගයේ ගීත සඳහා සංගීතය නිර්මාණය කළේ ඉන්දියානු සංගිතඥයින් වන **විශ්වනාත් ලෞජී, අබ්දුල් යතාර්, ජටා ශංකර්** වැනි සංගීතඥයන් ය.

ඉන්පසු ඉංග්‍රීසි, ද්‍රවිඩ, හින්දි තනු පාදක කොට එම තනු වලට සිංහල වචන යොදා ගීත තැටිගත කළ අතර මෙම අනුකාරක තනු යුගයේ දී ගීතවල වචන වලට වඩා ගීතවල තනුව නැතහොත් නාද මාලාව ප්‍රමුඛස්ථානයක් ගන්නා ලදි. තැටි සමාගම් වල තිබූ තරගකාරීත්වය හේතුවෙන් මෙම යුගයේ එකම තනුවට ගීත එකකට වඩා තැටිගත කළ අතර මෙම ගීත කොලොම්බියා හා H.M.V. (His Master's Voice) ලේබලය යටතේ තැටිගත විය.

සමාන තනු සහිත පහත ගීත ශ්‍රවණය කරන්න.

- තේ පැන් දින දින වැඩි වැඩියෙන්
  ශ්‍රී සෙත් සාදයි මොක්ෂ පුරේ

- මහ බෝධි මූලේ
  මහ ශාක්‍ය කුලේ

# හින්දි තනු අනුකාරක ගීත සඳහා උදාහරණ

| | සිංහල ගීතය | මුල් තනුව |
|---|---|---|
| 1 | දුල් සල්වනේ ලකල්... ( කොලොම්බියා ලේබලය යටතේ ) | චල් චල් තෙ නෞජ් වාන්... |
| 2 | මහ බෝධි මුලේ විදුරසුනේ... | අව තේර ශිවා... |
| 3 | කෝ සැපතා මේ සංසාරේ... | ලෝ දුනියා හේ රඛවාලේ... |

# පසුකාලීන ගායක ගායිකාවන්

- ග්‍රේටා ජෙනට් ද සිල්වා
- H.W. රූපසිංහ මාස්ටර්
- රුක්මනී දේවී
- එඩී ජයමාන්න






මීට අමතරව මුල් යුගයේ ගී තනු රාගධාරී සංගීතය පදනම් කොටගෙන ද නිර්මාණය වී තිබුණි.

උදා :

- චින්තාමනී ද්‍රවිඩ චිත්‍රපටයේ පිට දීප දේශ ජයගත්තා - පීළු රාගය
- කරුණා මුහුදේ නාමු ගිලීලා - භිම්පලාසි රාගය
- සාධු සිරිපා ශ්‍රී මුණිඳුගේ - තිලංග රාගය

මෙම යුගයේ ගීත සඳහා යොදා ගත්තේ ඉතා අල්ප සංගීත භාණ්ඩ සංඛ්‍යාවකි. සර්පිනා, තබ්ලා, වයලින්, පියානෝ වැනි භාණ්ඩ මුල් කාලයේ යොදාගත් අතර 1950 පමණ වන විට Box ගිටාර්, සිතාර්, බටනලා, ක්ලැරිනට්, ජපන් මැන්ඩලින් වැනි භාණ්ඩ ද එක් වූ අතර වාදක මණ්ඩලය සමහර විටෙක 100 ද ඉක්මවා ගිය අවස්ථා තිබුණි.

මෙලෙස ක්‍රමයෙන් වර්ධනය වූ ග්‍රැමෆෝන් ගීත 1937 පමණ වන විට වෙනස් මගකට යොමු විය.

සංගිත අධ්‍යාපනය ලැබීමට ඉන්දියාවට ගොස් සිටි ආනන්ද සමරකෝන්, සුනිල් ශාන්ත  වැනි ශිල්පීන් සිය අධ්‍යාපන කටයුතු නිමවා නැවත මෙරටට පැමිනීමත්, ඔවුන් විවිධ සංගීත සම්ප්‍රධායන්ට ගැති නොවී ස්වධීන ගීත නිර්මාණ සඳහා යොමු වීමත් මෙම වෙනසට හේතු විය.

ආරම්භයේ තරමක් දුරට වංග සංගීතයේ ගී තනු, ජන නාද රටා සිය ගීත නිර්මාණ සඳහා යොදා ගත්ත ද පසුකාලීනව මොවුන් අතින් නිර්මාණය වූ බොහොමයක් ගීත ස්වාධීන නිර්මාණ විය. විශේෂයෙන්ම හෙළ බස, සරළ භාෂාව, සරල තනු මෙම යුගයේ දක්නට ලැබුණි.

පසුකාලීනව මෙම ආරට තවත් ගීත නිර්මාණය විය.

- සූර්ය ශංකර් මොල්ලිගොඩ - අක්කෙ අක්කෙ අර බලන්නකෝ
- W.D.ඇල්බට් පෙරේරා හා මල්ලිකා - පීනමුකෝ කළු ගඟේ
- P.L.A. සෝමපාල - ලලිත කලා

පහත ගීත ද හොඳින් ශ්‍රවණය කරන්න.

- ✓ සීතා මා සිරියා ඉන්නේ
- ✓ ශ්‍රී සෙත් සාදයි මොක්ෂ පුරේ
- ✓ පිට දීප දේශ ජයගත්තා
- ✓ බැස සීතල ගඟුලේ
- ✓ පීනමුකෝ කළු ගඟේ

එක් එක් යුගයේ ග්‍රැමෆෝන් ගීතයේ සිදු වී ඇති වෙනස්කම් අවබෝධ කර ගන්න. ආරම්භක යුගයේ ගීත වලට වඩා ස්වාධීන යුගය වන විට පද මාලාව, තනුව, ගායනා කරන ශෛලිය වෙනස් වන අයුරු අවධාරණය කර ගන්න.

පසුකාලීනව මොහොමඩ් ගවුස් ශූරීන් හා B.S.පෙරේරා මහතා විසින් සංගීතය සපයා ඇති චිත්‍රපට වල ගීත ද ග්‍රැමෆෝන් තැටියට නැගුණි. භාග්‍ය රතී ගායිකාව ගැයූ ශාන්ත මේ රාත්‍රියේ, ප්‍රීති ප්‍රීති වැනි ගීතජ් සඳහා  නිදසුන් ලෙස ගත හැක.

කෙසේ වුවත් ග්‍රැමෆෝන් ගී යුගය ශ්‍රී ලාංකීය සංගීතයේ උන්නතියට වැදගත් මෙහෙයක් ඉටු කළ බව පැහැදිලි කරුණකි. ග්‍රැමෆෝනයේ ආගමනය හේතු කොට ගෙන ශ්‍රී ලංකාවේ සංගීතයේ සිදු වූ වෙනස්කම් ලෙස  පහත කරුණු දැක්විය හැක.

- තබ්ලා, සර්පිනා, වයලින් වැනි සංගීත භාණ්ඩ ප්‍රචලිත වීම හා ඒ පිළිබඳ උනන්දුවක් ඇති වීම.
- වාද්‍ය ශිල්පීන් බිහි වීම.
- විවිධ සංගීත භාණ්ඩ වාදනයට පෙළඹීම.
- අර්ථවත් පද මාලාවලින් යුතු ගීත නිර්මාණය වීම. (ප්‍රේමය, සෞන්දර්යය, උපදේශාත්මක ගීත, ආගම, භක්තිය දක්වන පද මාලා)
- විවිධ සංගීත පද්ධති ඇසුරින් සංගීත නිර්මාණයට පෙළඹීම. (හින්දුස්ථානි සංගීතය, වංග සංගීතය, බටහිර සංගීතය )

## ග්‍රැමෆෝන් ගී වල ලක්ෂණ

- ගීත වල තනුවට මුල් තැන දීම.
- ගීත වල නිශ්චිත සංගීතමය ආකෘතිය එනම්, ස්ථායී අන්තරා ආකෘතිය
- මුල් යුගයේ ගීත වල ආරම්භක හා අතුරු වාදනය සඳහා ගීතයේ මුල් කොටසේ පද මාලාවම භාවිත කිරීම.
- මුල් යුගයේ ගීත විවෘත කටහඬකින් ගායනා කර තිබීම.
- හින්දුස්ථානි රාග තාල හා සංගීත භාණ්ඩ භාවිතය
- උත්තර භාරතීය, අපරදිග සංගීතය, රවීන්ද්‍ර සංගීතය පාදක කොටගත් අනුකරණාත්මක ගීත බිහිවීම.

# <u>ග්‍රැමෆෝන් ගායක ගායිකාවන්</u>

- A.R.M. ඊබ්‍රාහිම්
- A.M.U. රාජ්
- ලතීෆ් බායි
- විවියන් ද සිල්වා
- ග්‍රේටා ජෙනට් ද සිල්වා
- රාජ ලක්ෂ්මී
- H.W. රූපසිංහ
- රුක්මනී දේවි
- ලක්ෂ්මි බායි
- J. සාදිරිස් සිල්වා
- J. සාදිරිස් සිල්වා
- ස්ටැන්ලි මල්ලවආරච්චි
- ලීලාවතී
- චාර්ල්ස් පෙරේරා
- ඇනී බොතේජු
- ඇනී රොට්ලස්
- කෝකිල දේවී වීරතුංග
- මොහිදීන් බෙග්
- M.B. ජොහර්ෂා
- H.W. පෙරේරා
- B. එඩී ද සිල්වා
- ආනන්ද සමරකෝන්
- සුනිල් ශාන්ත
- සූරිය ශංකර් මොල්ලිගොඩ
- W.D. ඇල්බට් පෙරේරා
- චිත්‍රා සෝමපාල
- ලතා වල්පොල